*සැ. යු.-* 2022.07.29 දින පළ කරන ලද අංක 2291 *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,292 - 2022 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2022.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 998 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1004 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ. යු. -(i) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අගෝස්තු මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

**ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය - මාතර කඩවත් සතර**

වන්දනා ගමන් ආඥාපනත

**මාතර අප ස්වාමීදුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික උත්සවය**

මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර අප ස්වාමීදුවගේ සිද්ධස්ථානයේ (මාතර මෑණියන්ගේ දේවස්ථානයේ) වාර්ෂික මංගල්‍යය 2022 සැප්තැම්බර් මස 04 වැනි ඉරිදා දින සිට සැප්තැම්බර් 11 වැනි ඉරුදින දක්වා පැවැත්වෙන බව (175 වැනි අධිකාරිය වන) වන්දනා ගමන් ආඥා පනත යටතේ සකස් කර 1991 නොවැම්බර් මස 01 දින හා 687 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන රෙගුලාසිවල 2 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කේ. එන්, කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර කඩවත් සතර.

2022 ජූලි මස 21 වැනි දින,
මාතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08 - 11

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෝරතීවුපත්තු වෙල්ලා වේල්**

මඩකලපුව මණ්ඩූර් ශ්‍රී කන්දස්වාමි දේවාලයේ වාර්ෂික උත්සවය

මඩකලපුව මණ්ඩූර් ශ්‍රී කන්දස්වාමි දේවාලයේ වාර්ෂික උත්සවය 2022.08.21 වැනි දින ප. ව. 8.30 කොඩිය එසවීමෙන් ආරම්භ වී ඉන්පසු 2022.09.10 වැනි දින පෙ. ව. 10.30 ට දිය කැපීමේ උත්සවය පැවැත්වේ. පසුව එදින රාත්‍රී 9.00 ට කොඩිය පහත හෙලීමෙන් උත්සවය අවසන් වේ.

1949.05.27 වැනි දින හා අංක 5886 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මෙම කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක වන බව මහජනතාවට දැනුම් දෙමි.

ආර්. රාහුලනායහි
ප්‍රාදේශීය ලේකම්,
පොරතීවුපත්තු.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පෝරතීවුපත්තු.

08 - 18

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/39/2022/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.05** වැනි දින සිට **2022.08.19** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.08.26** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ, 1321 වෙළුමේ 60 පත්ඉරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ, බොරලැස්ගමුව පිහිටි බක්මීගහදෙණිය නැමැති ඉඩම සඳහා මායිම්,<br>උතුර : යහම්පත් ආරච්චිගේ දොන් ජෝශප් කරුණාරත්න හා අන්අයගේ ඉඩම්,<br>නැගෙනහිර : යහම්පත් ආරච්චිගේ දොන් ජෝශප් අප්පුහාමිගේ ඉඩමේ කොටස,<br>දකුණ : අළුත්ගේ දොන් ජෝශප් හා අන් අයගේ මෙම ඉඩමේ කොටස්,<br>බස්නාහිර : අළුත්ගේ දොන් පීරිස්ගේ මෙම ඉඩමේ කොටස.<br>බිම් ප්‍රමාණය : රූ. 02 | 01. එස්. වික්‍රමසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1981.09.07 දින ලියා සහතික කරන ලද අංක 5828 දරන තෑගි ඔප්පුව.<br>02. එස්. වික්‍රමසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1983.04.27 දින ලියා සහතික කරන ලද අංක 5928 දරන තෑගි ඔප්පුව. |

08-19

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/32/2021/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.05** වැනි දින සිට **2022.08.19** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.08.26** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොට්ඨාසයේ, 216 වෙළුමේ 61 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, සියනෑ කෝරළේ, මීගහවත්තේ පිහිටි "ගොන්නගහවත්ත *හෙවත්* දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. එෆ්. ගුණසේකර මහතා විසින් මැන සාදන අංක 2648/1948.01.19-23 දිනැති පිඹුරේ ලොට් 2 සඳහා මායිම්,<br>උතුර : පාරක්,<br>නැගෙනහිර : ලොට් 03,<br>දකුණ : ලොට් 22,<br>බස්නාහිර : ලොට් 01.<br>බිම් ප්‍රමාණය : ප. 04.978 | 01. ගම්පහ අතිරේක දිසා විනිසුරුගේ 1949.04.29 දින අංක 928/3958/සී බෙදුම් දරන අවසාන තීන්දු ප්‍රකාශය.<br>02. ඩී. සී. ගුණවතී ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1998.03.19 දින ලියා සහතික කරන ලද අංක 15246 දරන තෑගි ඔප්පුව. |
| ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොට්ඨාසයේ, 216 වෙළුමේ 63 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, සියනෑ කෝරළේ, මීගහවත්තේ පිහිටි "ගොන්නගහවත්ත *හෙවත්* දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. එෆ්. ගුණසේකර මහතා විසින් මැන සාදන අංක 2648/1948.01.19-23 දිනැති පිඹුරේ ලොට් 04 සඳහා මායිම්, | 01. ගම්පහ අතිරේක දිසා විනිසුරුගේ 1949.04.29 දින අංක 928/3958/සී බෙදුම් දරන අවසාන තීන්දු ප්‍රකාශය.<br>02. ඩී. සී. ගුණවතී ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1998.03.19 දින ලියා සහතික කරන ලද අංක 15246 දරන තෑගි ඔප්පුව. |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| | උතුර : පාරක්,<br>නැගෙනහිර : ලොට් 05,<br>දකුණ : ලොට් 22,<br>බස්නාහිර : ලොට් 03.<br>බිම් ප්‍රමාණය : ප. 04.978 | |

08-20

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/32/2022/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.05** වැනි දින සිට **2022.08.19** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.08.26** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ කොට්ඨාසයේ, 132 වෙළුමේ 81 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, චන්ද්‍රලේඛා මාවතේ, ඩොක්ටර් එන්. එම්. පෙරේරා මාවත පිහිටි ඉඩමට කේ. ජී. ක්‍රිෂ්ණපිල්ලේ මිනින්දෝරු මහතාගේ අංක 1074/2013.05.18 දරන පිඹුරේ ඉඩම් කැබලි අංක 06, වරිපනම් අංක 101 සඳහා මායිම්, | 01. කොළඹ අතිරේක දිසා විනිසුරුගේ 2016.05.30 දින අංක 18648/පී බෙදුම් දරන අවසාන තීන්දු ප්‍රකාශය. |

| *I වැනි තීරුව* <br> *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* <br> *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* <br> *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | උතුර : මෙම පිඹුරේ කැබලි අංක 5, <br> නැගෙනහිර : ඩොක්ටර් එන්. එම්. පෙරේරා මාවත, ව. අ. 103 දරන ස්ථානය, <br> දකුණ : ඩොක්ටර් එන්. එම්. පෙරේරා මාවත, <br> බස්නාහිර : චන්ද්‍රලේඛා මාවත. <br> බිම් ප්‍රමාණය : පර්. 15.96 | |

08-21

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/41/2022/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.05** වැනි දින සිට **2022.08.19** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.08.26** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* <br> *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* <br> *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* <br> *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ, 1294 වෙළුමේ 149 පත්ඉරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, නාවල පිහිටි ආරෝසියා | 01. සී. එන්. ජී. විජේරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1980.11.20 දින ලියා සහතික කරන ලද අංක 1658 දරන අද්මිනිස්ත්‍රාසි පැවරුම්කරය. |

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | වත්ත නැමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. සෙනවිරත්න මහතා විසින් අංක 210-1980.11.17 දින මැන සාදන ලද ලොට් 1 සඳහා මායිම්,<br><br>උතුර : පාර,<br>නැගෙනහිර : ව. අ. 192/4, නාවල පාර,<br>දකුණ : ව. අ. 05, පන්සල පාර,<br>බස්නාහිර : ව. අ. 192/2, නාවල පාර.<br><br>බිම් ප්‍රමාණය : පර්. 13.75 | 02. එල්. පී. සේරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1982.02.18 දින ලියා සහතික කරන ලද අංක 40 දරන තෑගි ඔප්පුව.<br><br>03. එම්. ජේ. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2007.08.16 දින ලියා සහතික කරන ලද අංක 474 දරන විකුණුම් ඔප්පුව. |

08-22

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - එරාවූර් පත්තු, වෙංකලඩි**

වන්දනා ගමන් ආඥාපනත

**සිත්තාන්ඩි ශ්‍රී වේලායුධ සුවාමි කෝවිල් උත්සවය - 2022**

ඉහත සඳහන් උත්සවය 2022 අගෝස්තු මස 26 වැනි දින ආරම්භ කර 2022 සැප්තැම්බර් 10 වැනි දින දක්වා පවත්වන බව උත්සවයට සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1984.07.16 වැනි දින අංක 9866 දරන ආණ්ඩුවේ *ගැසට්* නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ සහ අනෙකුත් අයගේ අවධානය සඳහා මෙයින් යොමු කරමි.

කේ. තනපාලසුන්දරම්,
ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
එරාවූර් පත්තු,
වෙංකලඩි.

08 - 49

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොටපොල**

වන්දනා ගමන් ආඥාපනත (175) වැනි අධිකාරිය - ගැටබරු රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ උත්සවය - 2022

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික ගැටබරුව රජමහා විහාරස්ථානයේ ඇසළ උත්සවය 2022 සැප්තැම්බර් මස 06 දින සිට සැප්තැම්බර් මස 11 දින දක්වා පවත්වනු ලබන බව (175 අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥාපනත යටතේ 1988 මාර්තු 31 වැනි දින නිකුත් කරන ලද අංක 500 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස 1 ඡේදයේ (සාමාන්‍ය) ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ මෙයින් දන්වමි.

ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2022 ජූලි මස 27 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

08 - 50

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2022 ජනවාරි මස 26 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සීහි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන කේ. ඩී. ඒ. සී. අබේසේකර, සී. පී. ඩබ්ලිව්. මීගහවෙල, එන්. එස්. රණතුංග විසින් ලියා සහතික කරන ලද 2015.02.25, 2015.03.04 සහ 2015.03.11 දිනැති අංක 7313/944/968, ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. සී. අබේසේකර විසින් ලියා සහතික කරන ලද 2017.07.06 දිනැති අංක 8608, ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. සී. අබේසේකර විසින් ලියා සහතික කරන ලද 2019.01.02 දිනැති අංක 9273 සහ 9275 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද අංක PV 11641 දරන ලියාදිංචි අංකය යටතේ පළාපත්වෙල සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන නන්දසිරි හාඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2021 සැප්තැම්බර් මස 30 වැනි දිනට නන්දසිරි හාඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 7313/944/968, 8608, 9273 සහ 9275 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් දෙකෝටි හැට හය ලක්ෂ තිස් නව දහස් පන්සිය හැට තුනයි ශත හතලිස් පහක (රු. 26,639,563.45) මුදලක් ද, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි හැත්තෑ පන් ලක්ෂ දස දහස් පන්සිය හතරයි ශත විසි එකක (රු. 17,510,054.21) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් (සෑම මාසයකම අවසාන සතියේ පවත්නා - Last week monthly spot) සියයට පහයි දශම පහක් (5.5%) වූ අනුපාතිකය මත පොළිය ද සහ රුපියල් හැත්තෑ නව ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය විසි හයයි ශත පහක (රු. 7,953,326.05) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම එකයි එකක් (8.11%) වූ ස්ථිර අනුපාතිකය මත පොළිය ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් දෙකෝටි හැට හය ලක්ෂ තිස් නව දහස් පන්සිය හැට තුනයි ශත හතලිස් පහක (රු. 26,639,563.45) මුදලක් ද, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් එක් කෝටි හැත්තෑ පන් ලක්ෂ දහ දහස් පනස් හතරයි ශත විසි එකක (රු. 17,510,054.21) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළි අනුපාතිකයට (AWPR) ඉහළින් (සෑම මාසයකම අවසාන සතියේ පවත්නා - Last week monthly spot) සියයට පහයි දශම පහක් (5.5%) වූ අනුපාතිකය මත පොළිය ද සහ රුපියල් හැත්තෑ නව ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය විසි හයයි ශත පහක (රු. 7,953,326.05) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම එකයි එකක් (8.11%) වූ ස්ථිර අනුපාතිකය මත පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 7313/944/968, 8608, 9273 සහ 9275 දරන උකස් බැඳුම්කරයන් මගින්, නන්දසිරි හාඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන දේපළ, බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### අංක 7313/944/968, 8608, 9273 සහ 9275 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කෝට්ඨාසයේ, මාතලේ, පලාපත්වෙල ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත මාතලේ දකුණ ගම්පහ සිය පත්තුවේ, කිරිගල්පොත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුගම පිහිටි "ගෝනටුවෙවත්ත සහ ගෝනටුවේයාය *හෙවත්* ගොලුවැල්ලේහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද 2000.03.26 දිනැති අංක 1158 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 315A දරන පිඹුරේ ලොට් B ද, නැගෙනහිරට : මාතලේ බටහිර වත්ත, ජනපද වත්ත (Colony Estate) ද, දකුණට : මාතලේ බටහිර වත්ත, ජනපද වත්ත සහ මෙල්ඩර් මහතාගේ ඉඩම ද, සහ බස්නාහිරට : මාතලේ සිට දඹුල්ලට යන ප්‍රධාන මාර්ගය ද වශයෙන් මායිම් වූ එකී අංක 1158 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් පහළොවයි දශම පහක් (අ.3, රූ.0, පර්.15.5) *හෙවත්* හෙක්ටයාර 1.254ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

**ඉහත කී ඉඩම් කොටස පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මැනීමක් වේ.**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ, පලාපත්වෙල ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත මාතලේ දකුණ ගම්පහ සිය පත්තුවේ, කිරිගල්පොත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උඩුගම පිහිටි "ගෝනටුවෙවත්ත සහ ගෝනටුවේයාය *හෙවත්* ගොලුවැල්ලේහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් සාදන ලද 1957.04.06 දිනැති අංක 315A දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 315A දරන පිඹුරේ ලොට් B ද, නැගෙනහිරට : මාතලේ බටහිර වත්ත, ජනපද වත්ත (Colony Estate)ද, දකුණට : මාතලේ බටහිර වත්ත, ජනපද වත්ත සහ මෙල්ඩර් මහතාගේ ඉඩම ද සහ බස්නාහිරට : මාතලේ සිට දඹුල්ල යන ප්‍රධාන මාර්ගය ද වශයෙන් මායිම් වූ එකී අංක 315A දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් පහළොවයි දශම පහක් (අ.3, පර්. 15.5) හෙවත් හෙක්ටයාර 1.254ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේද සමග වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී.

08 - 28

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වාරියපොළ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ජයසේකර පොහොන්සූරිය අප්පුහාමිලාගේ ලිලන්ත දර්ශන

2022 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ආර්. පී. ගාල්ලගේ විසින් ලියා සහතික කරන ලද අංක 2321 හා 2014.01.31 දින දරන සහ කුරණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් ලියා සහතික කරන ලද අංක 5148 හා 2018.01.08 දින දරන උකස් බැඳුම්කර (මෙහි පළමුවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති දේපළ) මත අයවිය යුතු මුදල් ගෙවීම ජයසේකර පොහොන්සූරිය අප්පුහාමිලාගේ ලිලන්ත දර්ශන යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති තිබේ.

තව ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ආර්. පී. ගාල්ලගේ විසින් ලියා සහතික කරන ලද අංක 3001 හා 2015.11.06 දින දරන උකස් බැඳුම්කරය (මෙහි දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති දේපළ) මත අයවිය යුතු මුදල් ගෙවීම ජයසේකර පොහොන්සූරිය අප්පුහාමිලාගේ ලිලන්ත දර්ශන යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති අතර, ඒ අනුව එකී බැඳුම්කර මත ඔබ වෙත ප්‍රදානය කරන ලද වාරික ණය පහසුකමක් මත 2022 ජනවාරි 06 වැනි දිනට (රු. 7,828,927.82) රුපියල් මිලියන හතයි අට ලක්ෂ විසි අට දහස් නමසිය විසි හතයි ශත අසූ දෙකක මුදලක් පමණක් දැන් හැටන් නැෂනල් බැනක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව විකුණුම් දිනය දක්වා රු. 6,249,238.62ක ප්‍රාග්ධන හිඟ මුදල මත 2022.01.07 වැනි දින සිට වර්ෂයකට 16.5%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 7,828,927.82ක මුදල ප්‍රචාරණ පිරිවැය සහ මුදල් ලැබෙනතුරු දරන ලද අනෙකුත් ගාස්තු, ගෙවීම් (ඇත්නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2321, 5148 සහ 3001 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි පළමුවන සහ දෙවන උපලේඛනවල විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙනදේසිකරු අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

**පළමුවන උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, දේවමැද්ද කෝරළේ, වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වාරියපොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 1245 - වාරියපොළ ග්‍රාම නිලධාරී වසම තුළ, වාරියපොළ ගමේ පිහිටි "තෙලඹුගහමුලගාව හේන, කොටුවෙලේහේන දැන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආරියදාස අතපත්තු විසින් සාදන ලද අංක 341/2011 හා 2011.12.31 දින දරන පිඹුරේ ලොට් 4 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ඉහත කී අංක 341/2011 දරන පිඹුරේ ලොට් 5 දරන අඩි 12ක් පළල පාර ද, නැගෙනහිරට : පුත්තලම සිට කුරුණෑගල දක්වා ප්‍රධාන පාර ද, දකුණට : සොමිනෝනා හාමිනේට අයත් දැන් සෝමරත්න සහ තවත් අය හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට : ඉහත කී අංක 341/2011 දරන පිඹුරේ ලොට් 03 ද මායිම් වූ රූඩ් එකයි පර්චස් දහතුනයි දශම තුනක් (රූ.01, පර්. 13.3) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් ඇතුළු සෑම සියලු දේද වේ.

## දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, දකුණු දේවමැද්ද කෝරළේ, වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වාරියපොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 1239 - විලකටුපොත ග්‍රාම නිලධාරි වසම තුළ හොරඹුව ගමේ පිහිටි "හොරඹුව වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කෝලිත එස්. දසනායක විසින් සාදන ලද අංක 2696 හා 2014.09.15 දින දරන පිඹුරේ ලොට් 12 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එෆ්වීපී 2511 හි ලොට් 38 ද, නැගෙනහිරට : ඉහත කී අංක 2696 දරන පිඹුරේ ලොට් 11 ද, දකුණට : ඉහත කී අංක 2696 දරන පිඹුරේ ලොට් ආර්1 (අඩි 20ක (ප්‍රවේශ මාර්ගය) සහ බස්නාහිරට : ඉහත කී අංක 2696 දරන පිඹුරේ ලොට් 16 ද මායිම් වූ පර්චස් දහසයක් (පර්. 16) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, වගාවන් ඇතුළු සෑම සියලු දේද වේ. තව ද, ඉහත කී අංක 2696 දරන පිඹුරේ ලොට් ආර්1, ආර්2 සහ ආර්3 වශයෙන් දක්වා ඇති මාර්ගයන් පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

ඉහත කී අංක 2696 දරන පිඹුරේ ලොට් 12, පහත දැක්වෙන ඉඩම් කොටසින් බෙදා වෙන්කරන ලද කොටසක් වේ.

ඉහත කී හොරඹුව ගමේ පිහිටි "හොරඹුව වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කෝලිත එස්. දසනායක විසින් සාදන ලද අංක 2659 හා 2014.08.04 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එෆ්වීපී 2510 - විලකටුපොත සහ එෆ්වීපී 2511 හි ලොට් 38ද, නැගෙනහිරට : පාර (මා.ස.අ.) (පුත්තලම සිට කුරුණෑගල දක්වා) ද, දකුණට : අංක 2013/169 දරන පිඹුරේ ලොට් 02 සහ බස්නාහිරට : එෆ්වීපී 2521 - පාලුගම ද මායිම් වූ අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් දහඅටයි දශම දෙකක් (අ.3, රූ.3, පර්.18.2) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, වගාවන් ඇතුළු සෑම සියලු දේද වේ.

ඉහත කී අංක 2659 දරන පිඹුරේ ලොට් ඒ, පහත දැක්වෙන ඉඩම් කොටස නැවත මැනීමක් වේ.

ඉහත කී හොරඹුව ගමේ පිහිටි "හොරඹුව වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. තිලකරත්න බණ්ඩා විසින් සාදන ලද අංක 2013/169 හා 2013.10.03 දින දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එෆ්වීපී 2510 සහ එෆ්වීපී 2511 හි ලොට් 38 ද, නැගෙනහිරට : පාර (මා.ස.අ.) (පුත්තලම සිට කුරුණෑගල දක්වා) ද, දකුණට : අංක 2013/169 දරන පිඹුරේ ලොට් 02 සහ බස්නාහිරට : එෆ්වීපී 2521 ද මායිම් වූ අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් දහඅටයි දශම දෙකක් (අ.3, රූ.3, පර්.18.2) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, වගාවන් ඇතුළු සෑම සියලු දේද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස් - 75/22හි ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මරදගහමුල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

එදිරිසිංහ ආරච්චිගේ යමුනා චාන්දනී එදිරිසිංහ

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් එදිරිසිංහ ආරච්චිගේ යමුනා චාන්දනී එදිරිසිංහ වෙත ප්‍රදානය කරන ලද රුපියල් මිලියන පහයි හත් ලක්ෂ හැට හතර දහස් හත්සිය විසි හතයි ශත තිස් තුන (රු. 5,764,727.33)ක ප්‍රතිව්‍යුහගත කරන ලද ප්‍රාග්ධන ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 96 හා 2013.11.22 දින දරන උකස් බැඳුම්කරය සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 1058 හා 2017.12.07 දින දරන, අංක 1726 හා 2020.06.26 දින දරන උකස් බැඳුම්කර සහ 2016.02.10 දින දරන උකස්කිරීමේ සාධනපත්‍රය මගින් එදිරිසිංහ ආරච්චිගේ යමුනා චාන්දනී එදිරිසිංහ යන අය ණයකරු/උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එදිරිසිංහ ආරච්චිගේ යමුනා චාන්දනී එදිරිසිංහ යන අය විසින් එකී අංක 96, 1058, 1726 දරන උකස් බැඳුම්කර සහ 2016.02.10 දින දරන උකස් කිරීමේ සාධනපත්‍රය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022.05.17 වැනි දින දිනට රුපියල් මිලියන හයයි එක් ලක්ෂ හැත්තෑ නම දහස් නමසිය හයයි ශත විසි නවය (රු. 6,179,906.29)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව එතෙක් කරන

ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා 5,764,727.33ක ප්‍රාග්ධන හිඟය මත 2022.05.18 වැනි දින සිට වර්ෂයකට AWPLR + 2.5% (වර්ෂයකට 13.56%)ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී (රු. 6,179,906.29)ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 96, 1058, 1726 දරන උකස් බැඳුම්කර සහ 2016.02.10 දින දරන උකස්කිරීමේ සාධනපත්‍රය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 87 - පහළ හපුවලාන ග්‍රාම නිලධාරි වසම තුළ පහල හපුවලානේ පිහිටි ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක 510049 දරන කැඩැස්තර සිතියමේ අංක 01 කට්ටියේ දැක්වෙන අංක 0012 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි නමයයි තුනයි තුනක් (හෙක්ටෙයාර් 0.1933) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙය මීගමුව ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සහතික අංක 0003115 යටතේ ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි<br>
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කුරුණෑගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

අබේසිරි මුණසිංහ දිනේන්ද්‍ර චම්පික මනමේන්ද්‍ර

නාලනී වසන්තා මුණසිංහ *විවාහයට පෙර* කොන්ගල රදීෂාන් යසස් මුණසිංහ

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අබේසිරි මුණසිංහ දිනේන්ද්‍ර චම්පික මනමේන්ද්‍ර, නාලනී වසන්තා මුණසිංහ විවාහයට පෙර කොන්ගල සහ රදීෂාන් යසස් මුණසිංහ වෙත පිළිවෙලින් ප්‍රදානය කරන ලද රු. 130,000,000.00ක වාරික ණය පහසුකම, රු. 25,000,000.00ක ස්ථාවර අයිරා පහසුකම සහ රු. 50,000,000.00ක වාරික ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 3826 හා 2014.09.17 දින දරන (අර්ධ වශයෙන්), අංක 4100 හා 2015.06.10 දින දරන සහ අංක 4151 හා 2015.07.21 දින දරන උකස් බැඳුම්කර මගින් අබේසිරි මුණසිංහ දිනේන්ද්‍ර චම්පික මනමේන්ද්‍ර, නාලනී වසන්තා මුණසිංහ විවාහයට පෙර කොන්ගල සහ රදීෂාන් යසස් මුණසිංහ යන අය ණයකරුවන් වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී අබේසිරි මුණසිංහ දිනේන්ද්‍ර චම්පික මනමේන්ද්‍ර, නාලනී වසන්තා මුණසිංහ විවාහයට පෙර කොන්ගල සහ රදීෂාන් යසස් මුණසිංහ යන අය විසින් එකී බැඳුම්කර මත සහ පිළිවෙලින් එකී රු. 130,000,000.00ක වාරික ණය පහසුකම, රු. 25,000,000.00ක ස්ථාවර අයිරා පහසුකම සහ රු. 50,000,000.00ක වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 මැයි 17 වැනි දිනට රු. 79,900,163.72, රු. 29,111,135.33 සහ රු. 37,457,921.09ක මුදලක් එකතුව රුපියල් මිලියන එකසිය හතලිස් හයයි හාර ලක්ෂ හැට නම දහස් දෙසිය විස්සයි ශත දහහතර (රු. 146,469,220.14)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, 2022 මැයි 18 සිට විකුණුම් දිනය දක්වා පිළිවෙලින් රු. 71,515,186.47 සහ රු. 33,456,825.09ක ප්‍රාග්ධන හිඟය මත 2022 මැයි 18 වැනි දින සිට පිළිවෙලින් වර්ෂයකට 9.50%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 79,900,163.72ක, වර්ෂයකට AWPLR + 3.5%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 29,111,135.33ක සහ වර්ෂයකට 9.75%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග රු. 37,457,921.09ක එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 3826, 4100 සහ 4151 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තීරගන්දහයේ කෝරලේ, වැඩඩ විල්ලි හත්පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කුරුණෑගල මහනගර සභා සීමාව තුළ, කුරුණෑගල නගරයේ 840 - කඩවීදිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි වරිපනම් අංක 21, මලියදේව වීදිය දරන "මුණසිංහ හොටෙල්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එස්. දසනායක විසින් සාදන ලද අංක 2527 හා 2014.02.18 දින දරන පිඹුරේ ලොට් ඒ සහ බී වශයෙන් ලකුණ කර ඇති එකටයාව පිහිටි ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 23 - මලියදේව වීදිය දරන පරිශ්‍රය වෙන්වන මායිම් බිත්තිය ද, නැගෙනහිරට : මලියදේව වීදිය වෙන්වන පදික වේදිකාව ද, දකුණට : වරිපනම් අංක 17බී - මලියදේව වීදිය දරන පරිශ්‍රය පෙන්වන මායිම් බිත්තිය සහ අංක 217/84 දරන පිඹුරේ ලොට් සී සහ බස්නාහිරට : අංක 217/84 දරන පිඹුරේ ලොට් සී සහ වරිපනම් අංක 38 - බෝධිරාජ මාවත දරන පරිශ්‍රය පෙන්වන මායිම් බිත්තිය ද මායිම් වූ පර්චස් හතරයි දශම නමයයි දෙකක් (පර්. 4.92) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/3

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හෙට්ටිපොල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

වර්ණකුලසූරිය මුහන්දිරම්ගේ එඩ්වඩ් සුනිල්
තෙන්නකෝන් කන්කානම්ලාගේ අයේෂා දමයන්ති

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වර්ණකුලසූරිය මුහන්දිරම්ගේ එඩ්වඩ් සුනිල් හා තෙන්නකෝන් කන්කානම්ලාගේ අයේෂා දමයන්ති වෙත ප්‍රදානය කරන ලද රු. 8,000,000.00ක වාරික ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කුළියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් හෙක්ටර් එස්. පී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 16206 හා 2018.08.13 දින දරන උකස් බැඳුම්කර මගින් වර්ණකුලසූරිය මුහන්දිරම්ගේ එඩ්වඩ් සුනිල් හා තෙන්නකෝන් කන්කානම්ලාගේ අයේෂා දමයන්ති ණයකරුවන් වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී වර්ණකුලසූරිය මුහන්දිරම්ගේ එඩ්වඩ් සුනිල් හා තෙන්නකෝන් කන්කානම්ලාගේ අයේෂා දමයන්ති යන අය විසින් එකී බැඳුම්කරය මත සහ ඔබ වෙත ප්‍රදානය කරන ලද එකී වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022 මාර්තු 14 වැනි දිනට රුපියල් මිලියන දොළහයි පන් ලක්ෂ පනස් හය දහස් හත්සිය අසූ හතරයි ශත පනස් අට (රු. 12,556,784.58)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 8,138,207.26ක ප්‍රාග්ධන හිඟය මත 2022 මාර්තු 15 වැනි දින සිට වර්ෂයකට 16%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 12,556,784.58ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 16206 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

**ඉඩම් අංක 01**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරතලාන කෝරලේ, දේවමැදි හත්පත්තුවේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ, දොලහමුන ග්‍රාම නිලධාරි වසම තුළ, දොලහමුන, ගිරතලාන සහ ගිරතලාන ආචාරිගම යන ගම්වල පිහිටි "දොලහමුනවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සාදන ලද අංක 2746 හා 2002 අප්‍රේල් 19 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 256/95 හා 1990 අගෝස්තු 05 දින දරන පිඹුරේ ලොට්2 ද, දකුණට : කේ. එම්. ටිකිරි බණ්ඩා සහ තවත් අය හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට : එම්. ජේ. සේතුංග බලයලත් මිනින්දෝරු විසින් සාදන ලද අංක 1077 හා 1971 දෙසැම්බර් 3 හා 5 දින

දරන පිඹුරේ ලොට් 101 ද මායිම් වූ පර්චස් විසි අටක් (පර්. 28) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද සමග වේ.

ඉහත කී ඉඩම, මෑතක දී කරන ලද මැනීමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බලයලත් මිනින්දෝරු එල්. එච්. ජේ. අමරදීප විසින් සාදන ලද අංක 501/2017 හා 2017 අගෝස්තු 21 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රධාන පාරට දිවෙන පාර ද, නැගෙනහිරට : අංක 256/95 හා 1990 අගෝස්තු 05 දින දරන පිඹුරේ ලොට් 2 ද, දකුණට : කේ. එම්. ටිකිරි බණ්ඩා සහ තවත් අය හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට : එම්. ජේ. සේනුංග බලයලත් මිනින්දෝරු විසින් සාදන ලද අංක 1077 හා 1971 දෙසැම්බර් 3 හා 5 දින දරන පිඹුරේ ලොට් 101 ද මායිම් වූ පර්චස් විසි අටක් (පර්. 28) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

**ඉඩම් අංක 02**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරතලාන කෝරලේ, දේවමැදි හත්පත්තුවේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරතලාන (අංක 1344) ග්‍රාම නිලධාරි වසම තුළ ගිරතලාන ගමේ පිහිටි "කෝන්ගහමුලහේන" සහ "නිදන්ගලගාවහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කෝලිත එස්. දසනායක විසින් සාදන ලද අංක 2884 හා 2015 මැයි 11 දින දරන පිඹුරේ ලොට් 6 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අඩි විස්සක් (20) පළල පාරක් සඳහා වෙන්කිරීම වන ඉහත කී අංක 2884 දරන පිඹුරේ ලොට් ආර් 1 ද, නැගෙනහිට : මඩුල්ල සිට හෙට්ටිපොල දක්වා වන මාර්ග සංවර්ධන අධිකාරියේ පාර ද, දකුණට : ඉහත කී අංක 2884 දරන පිඹුරේ ලොට් 7 සහ බස්නාහිරට : අඩි විස්සක් (20) පළල පාරක් සඳහා වෙන්කිරීම වන ඉහත කී අංක 2884 දරන පිඹුරේ ලොට් ආර් 2 ද මායිම් වූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද සමග වේ. තව ද, ඉහත කී අංක 2884 දරන පිඹුරේ ලොට් ආර් 1, ආර් 2 සහ ආර් 3 වශයෙන් ලකුණු කරන ලද මාර්ග සඳහා වෙන්කිරීම මතින් හා දිගේ වන මාර්ග අයිතිය ද සමග වේ.

**ඉඩම් අංක 03**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරතලාන කෝරළේ, දේවමැදි හත්පත්තුවේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ දොලහමුන (අංක 1337 ග්‍රාම නිලධාරි වසම තුළ දොලහමුන, ගිරතලාන සහ ගිරතලාන ආචාරිගම ගම්වල පිහිටි "දොලහමුනවත්ත" නමැත ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. එච්. ජේ. අමරදීප විසින් සාදන ලද අංක 446/2008 හා 2008 ජූලි 07 දින දරන පිඹුරේ ලොට් 6 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන, උතුරට : ඉහත කී අංක 446/2008 දරන පිඹුරේ ලොට් 5 ද, නැගෙනහිරට: අඩි විස්සක් (20) පළල පාරක් සඳහා වෙන්කිරීම වන අංක 1077 දරන පිඹුරේ ලොට් ආර් 6 ද, දකුණට : අඩි විස්සක් (20) පළල පාරක් සඳහා වෙන්කිරීම වන අංක 1077 දරන පිඹුරේ ලොට් 5 සහ අඩි විස්සක් (20) පළල පාරක් සඳහා වෙන්කිරීම වන අංක 446/2008 දරන පිඹුරේ ලොට් 10 සහ බස්නාහිරට : ඉහත කී අංක 446/2008 දරන පිඹුරේ ලොට් 7 ද මායිම් වූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද සමග වේ. තව ද, ඉහත කී අංක 1077 දරන පිඹුරේ ලොට් ආර් 5 සහ ලොට් ආර් 6 සහ අංක 446/2008 දරන පිඹුරේ ලොට් 10 වශයෙන් ලකුණු කරන ලද මාර්ග සඳහා වෙන් කිරීම පාවිච්චි කිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/4

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දඹුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

උපුල් ඉන්ද්‍රජිත් සේරසිංහ

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් උපුල් ඉන්ද්‍රජිත් සේරසිංහ වෙත ප්‍රදානය කරන ලද (රු. 12,550,000.00) රුපියල් මිලියන දොළහයි පන් ලක්ෂ පනස් දහසක වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ජයවර්ධන විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 9708 හා 2013.09.23 දින දරන අංක 11030 හා 2015.06.13 දින දරන , අංක 11885 හා 2016.06.30 දින දරන සහ අංක 13129 හා 2017.12.20 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතුව ඇති මුදල් ගෙවීම උපුල් ඉන්ද්‍රජිත් සේරසිංහ ණයකරු වශයෙන් පැහැර හැර තිබේ.

තව ද, එකී උපුල් ඉන්ද්‍රජිත් සේරසිංහ යන අය විසින් අනිකුත් පහසුකම් අතර ඔබ වෙත ප්‍රදානය කරන ලද එකී වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 මැයි 30 වැනි දිනට (රු. 15,171,843.22) රුපියල් මිලියන පහළොවයි එක් ලක්ෂ හැත්තෑ එක් දහස් අටසිය තිස් හතරයි ශත විසි දෙකක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 11,641,337.60ක ප්‍රාග්ධන හිඟය මත 2022 මැයි 31 වැනි දින සිට වර්ෂයකට AWPLR + 3.5%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 15,171,834.22ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 9708, 11030, 1185 සහ 13129 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ කොට්ඨාසයේ, කොහොන්සිය පත්තුවේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඊ347බී - කැන්දගොල්ල ග්‍රාම නිලධාරි වසම තුළ වරකාමුර, හලන්ගොඩ සහ පුරිප්පල ගම්වල දැන් අයිතාලියද්දේ පිහිටි "වරකමුරේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පී. ජී. ගුණතිලක විසින් සාදන ලද අංක 632 හා 2011.01.13 වඩාත් නිවැරදිව 2001.01.13 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : විනීතා මෙන්ඩිස් හිමිකම්පාන මෙම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : විල්වින් මෙන්ඩිස් හිමිකම්පාන මෙම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර සහ බස්නාහිරට : එස්. එම්. අමරකෝන් හිමිකම්පාන මෙම ඉඩමේම ඉතිරි කොටස ද මායිම් වූ පර්චස් තිස් තුනයි දශම බිංදුවයි එක (පර්. 33.01) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/5

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මීද්දෙනිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

බෙල්ලන ආචාරිගේ රචිත් මල්ෂාන්

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් බෙල්ලන ආචාරිගේ රචිත් මල්ෂාන් වෙත ප්‍රදානය කරන ලද රුපියල් මිලියන විසි හය (රු. 26,000,000.00)ක පුද්ගලික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිණිදිය විසින් ලියා සහතික කරන ලද අංක 4017 හා 2020.03.19 දින දරන උකස් බැඳුම්කරය මගින් බෙල්ලන ආචාරිගේ රචිත් මල්ෂාන් ණයකරු/උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී බෙල්ලන ආචාරිගේ රචිත් මල්ෂාන් යන අය විසින් එකී අංක 4017 දරන බැඳුම්කරය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන්, එකී බැඳුම්කරය මත 2022.04.30 වැනි දිනට රුපියල් මිලියන විසි පහයි එක් ලක්ෂ විසි අට දහස් පහළොවයි ශත දහහතර (රු. 25,128,015.14)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 24,607,893.14ක ප්‍රාග්ධන හිඟය මත 2022.05.01 වැනි දින සිට වර්ෂයකට 13%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 25,128,015.14ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 4017 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතරේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මාතර

මහනගර සභා සීමාව තුළ, කොටුවෙගොඩ උතුර ග්‍රාම නිලධාරි වසම තුළ, වරිපනම් අංක 225 (පැරණි අංකය 472), පරණ තංගල්ල පාර දරන කොටුවේගොඩ පිහිටි "දොන් අන්දිරිස් බරතොලමියුස් ආරච්චි මහත්මයාගේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රස්මි විසින් සාදන ලද අංක 4786 හා 2016.01.26 දින දරන පිඹුරේ ලොට් සී වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙම පිඹුරේම ලොට් බී ද, නැගෙනහිරට: මෙම පිඹුරේම ලොට් ඩී (පොදු ප්‍රවේශය) ද, දකුණට : පරණ තංගල්ල පාර සහ බස්නාහිරට : වෙලේහෙට්ටිගේවත්ත හෙවත් ජුලේගහවත්ත වරිපනම් අංක 22 ද මායිම් වූ පර්චස් විසි අටයි දශම හයයි හය (පර්. 28.66) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු සියල්ල වේ.

ඉහත කී කොටුවේගොඩ පිහිටි "දොන් අන්දිරිස් බරතොලමියුස් ආරච්චිමහත්මයාගේවත්ත" නමැති ඉඩමට සාදන ලද එකී අංක 4786 දරන පිඹුරේ ලොට් ඩී වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් වශනේ, උතුරට : මෙම පිඹුරේම ලොට් ඒ ද, නැගෙනහිරට : කාණුව ද, දකුණට: පරණ තංගල්ල පාර සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් ඒ, බී සහ සී ද මායිම් වූ පර්චස් දොළහයි දශම නමයයි බිංදුව (පර්. 12.90) විශාලත්වයෙන් යුත් ඉඩම හරහා සහ ඒ දිගේ වන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/6

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිරිඳිවැල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 21,900,000.00ක වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 9121 හා 2011.11.24 දින දරන, අංක 9422 හා 2012.04.05 දින දරන, අංක 10221 හා 2013.07.01 දින දරන 11103 හා 2014.08.01 දින දරන අංක 12103 හා 2015.12.04 දින දරන හා අංක 13819 හා 2018.08.14 දින දරන උකස් බැඳුම්කර මගින් ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හා ප්‍රියන්ත අනුරුද්ධ පලිහවඩන උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

ප්‍රියන්ත අනුරුද්ධ පලිහවඩන යන අය, ඉහත කී ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් හි නියම හිමිකරු වන අතර, තව ද ඉහත කී ප්‍රියන්ත අනුරුද්ධ පලිහවඩන යන අය ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයකු වශයෙන් එකී සමාගමේ පාලනය සහ කළමණාකරණය දරන අතර, ඒ අනුව සමාගමේ ආයතනික වැස්ම නිරාවරණය කළහොත්, එවිට ඉහත කී ප්‍රියන්ත අනුරුද්ධ පලිහවඩන යන අය හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකමේ සත්‍ය ප්‍රතිලාභියා වේ.

තව ද, එකී ප්‍රිපා ඕගනික් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ප්‍රියන්ත අනුරුද්ධ පලිහවඩන යන අය, එකී බැඳුම්කර සහ එකී රු. 21,900,000.00ක වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022.04.17 වැනි දිනට රුපියල් මිලියන විසි දෙකයි පන් ලක්ෂ හැත්තෑ දහස් හත්සිය විසි හතයි ශත හැට හත (රු. 22,570,727.67)ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 21,900,000.00ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 18 වැනි දින සිට වර්ෂයකට 13.69%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 22,570,727.67ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු අයකරගැනීම සඳහා එකී අංක 9121, 9422, 10221, 11103, 12103 හා 13819 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි පළමුවන හා දෙවන උපලේඛනවල විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාධිපති මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

#### පළමු උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහවත්ත පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, මෙගොඩපොත උපකාර්යාල සීමාව තුළ, යටවක ග්‍රාම නිලධාරි

කොට්ඨාසය තුළ, යටවක පිහිටි "පිටදෙපැලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. අමරතුංග විසින් මැන සාදන ලද අංක 7377 හා 2011 අප්‍රේල් 08 දින දරන පිඹුරේ ලොට් 1 වශනේ ලකුණු කර ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ඇල ද, නැගෙනහිරටඃ ඇල ද, දකුණට : ලොට් 2 සහ පුෂ්පා ජයකොඩිගේ ඉඩම සහ බස්නාහිරට : ඊ. ගුණවතී සහ එස්. අනුලාවතීගේ ඉඩම ද මායිම් වූ එකී අංක 7377 දරන පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් තිහයි දශම පහ (අ.2, රූ.2, පර්.30.5)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ. මෙය අත්තනගල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම බී 69/76 යටතේ ලියාපදිංචි කර තිබේ.

## දෙවන උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහවත්ත පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, මෙගොඩපොත උපකාරයාල සීමාව තුළ, යටවක ග්‍රාමනිලධාරි කොට්ඨාසය තුළ, යටවක පිහිටි "හිතගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද අංක 7377 හා 1977 මාර්තු 18 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : සුභසිංහගේ අනුලාවතීගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 6971ඒ සහ 1987 මාර්තු මස 18 දින දරන පිඹුරේ ලොට් ඒ ද, දකුණට : සුබසිංහගේ අනුලාවතීගේ ඉඩම සහ බස්නාහිරට : පාර ද මායිම් වූ එකී අංක 7377 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතරයි දශම තුන (පර්. 4.3) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 36/7

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022** වර්ෂය | | | |
| **අගෝස්තු** | 2022.08.05 | සිකුරාදා | 2022.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.12 | සිකුරාදා | 2022.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.19 | සිකුරාදා | 2022.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.26 | සිකුරාදා | 2022.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2022.09.02 | සිකුරාදා | 2022.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.09 | සිකුරාදා | 2022.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.16 | සිකුරාදා | 2022.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.23 | සිකුරාදා | 2022.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.30 | සිකුරාදා | 2022.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2022.10.07 | සිකුරාදා | 2022.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.14 | සිකුරාදා | 2022.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.21 | සිකුරාදා | 2022.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.28 | සිකුරාදා | 2022.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.